**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ "ඒ" අර්ථසාධක අරමුදල - 2013**

**--------------------------------------------------------------------------------**

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ "ඒ" අර්ථසාධක අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයෙන් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1979 ජුනි 01 දිනැති අංක 38/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ I කොටස : (I) වගන්තිය සාමාන්‍ය; 9 ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ.තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2 මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ - "ඒ" අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) කල්පිරීමේදී ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් රු.30,034 ක් වූ ස්ථාවර තැන්පතු අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සාවද්‍ය ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පතු මත පොළී සහ ලැබිය යුතු පොළී මුදල් පිළිවෙලින් රු.19,317 කින් සහ රු.54,837 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ගැලපීම් කිරීමෙන් තොරව රු.138,687 ක් වූ අසාමාන්‍ය හර ශේෂයක් ශේෂ පත්‍ර දිනයට ගෙවිය යුතු බදු ගිණුමේ දක්වා තිබුණි.

(ඈ) අර්ථ සාධක අරමුදල් "ඒ" සහ"බී" මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කේවල අරමුදල් ශේෂයන් හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූපී ශේෂයන් අතර රු.11,140,713 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශේෂ පත්‍ර දිනට අරමුදලට කරන ලද රු.33,544,679 ක් වූ සමුච්චිත වාර්ෂික බැංකු දායකය අරමුදලට නිරවුල් කිරීමෙන් තොරව වර්ෂ ගණනාවක් ලැබිය යුතු මුදල් ලෙස දක්වා තිබුණි.

(ආ) ශේෂය නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව රු.18,268 ක මුදලක් 2004 වර්ෂයේ සිට අවිනිශ්චිත ගිණුමේ ( හිටපු සාමාජිකයන්) දක්වා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.5,663,546 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.6,390,735 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.727,189 කින් හෙවත් සියයට 11.37 කින් අඩුවීමක් පෙන්නුම් කෙරේ.

සමාලෝචිත වර්ෂය සඳහා  බැංකුවේ පරිපූරක දායකයත්වය රු.842,105 කින් අඩුවීම මෙම සෘණාත්මක ප්‍රවණතාවයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3.2 මෙහෙයුම් ප්‍රතිඵල

--------------------

### 3.2.1 මූල්‍ය සමාලෝචනය

----------------------

ලබාගත හැකිවූ තොරතුරු අනුව, පසුගිය වර්ෂ 04  සඳහා අරමුදලේ මෙහෙයුම් සාරාංශ කර පහත දැක්වේ.

| | 2013 | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| ස්ථාවර තැන්පතු ,සාමාජිකයන්ට දෙන ලද ණය හා ඉතිරි කිරීමේ ගිණුම් මත පොළී ආදායම | 1,013,264 | 844,336 | 1,250,822 | 2,103,734 |
| බැංකුවේ පරිපූරක දායකය | 5,222,951 | 6,065,056 | 5,271,604 | 5,514,266 |
| මුළු ආදායම | 6,236,215 | 6,909,392 | 6,522,426 | 7,618,000 |
| වියදම | (572,669) | (518,657) | (599,455) | (703,070) |
| වර්ෂය සඳහා අතිරික්තය / (ඌනතාවය ) | 5,663,546 | 6,390,735 | 5,922,971 | 6,914,930 |

මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණ කරනු ලැබේ.

(අ) 2010 සිට 2012 කාලපරිච්ඡේදය තුළදී ස්ථාවර වත්කම් මත පොළී ආදායම රු.1,714,287 සිට රු.381,171 දක්වා අඩුවී තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය තුළදී ස්ථාවර තැන්පතු ආයෝජනයන් වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම ආදායම ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු.381,171 සිට රු.647,793 දක්වා එනම් සියයට 69.9 කින් 2013 වර්ෂය තුළදී වැඩිවී තිබුණි.

(ආ) 2010 සිට 2011 කාල පරිච්ඡේදය තුළ සාමාජිකයන්ට දෙන ලද ණය මත පොළී ආදායම රු.389,447 සිට රු.444,107 දක්වා එනම් සියයට 14 කින් වැඩිවී තිබුණි. එසේ වුවද සාමාජිකයන් විසින් ණය නිරවුල් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2011 සිට 2013 දක්වා කාලපරිච්ඡේදය තුළදී රු.444,107 සිට රු.286,531 දක්වා සියයට 35 කින් එය අඩුවී තිබුණි.

### 3.2.2 සාමාජික දායකය

විගණනයට ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා අරමුදලට ලැබුණු දායකය හා පොළී සාරාංශ කර පහත දැක්වේ.

| | 2013 | | | | 2012 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | **සාමාජික දායකය** | **බැංකුවේ දායකය** | **බැර කරන ලද පොළී** | **එකතුව** | **සාමාජික දායකය** | **බැංකුවේ දායකය** | **බැර කරන ලද පොළී** | **එකතුව** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ජනවාරි 01 දිනට ශේෂය | 6,608,425 | 9,909,385 | 33,583,116 | 50,100,926 | 7,764,015 | 11,641,636 | 41,943,499 | 61,349,149 |
| **එකතු කළා** | | | | | | | | |
| වර්ෂය තුළ ලද දායකය | 740,960 | 1,111,441 | 5,663,546 | 7,515,947 | 901,866 | 1,352,803 | 6,390,735 | 8,645,404 |
| එකතුව | 7,349,385 | 11,020,826 | 39,246,662 | 57,616,873 | 8,665,881 | 12,994,438 | 48,334,233 | 69,994,553 |
| **අඩුකළා** | | | | | | | | |
| වර්ෂය තුළ ගෙවීම් | (1,558,360) | (2,336,868) | (9,574,521) | (13,469,749) | (2,057,456) | (3,085,053) | (14,751,117) | (19,893,626) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 5,791,025 | 8,683,958 | 29,672,141 | 44,147,124 | 6,608,425 | 9,909,385 | 33,583,116 | 50,100,927 |

2012 වර්ෂය සමඟ සැසඳීමේදී 2013 වර්ෂයේ අරමුදලට සාමාජිකයන්ගේ දායකය රු.160,906 කින් හෝ සියයට 18 කින් අඩුවී තිබුණු අතර, සාමාජිකයන්ගේ දායකයට සමානව බැංකුවේ දායකයද රු.241,362 කින් හෝ සියයට 18 කින් අඩුවී තිබුණි. 2012 වර්ෂය හා සසඳන විට 2013 වර්ෂයේදී මුළු ගෙවීම් රු.6,423,877 කින් හෝ සියයට 32.29 කින් අඩුවී තිබුණි.

### 3.2.3 සාමාජිකයන්ට ලබාදුන් ණය

(අ) විගණනයට ලබාගත හැකිවූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා සාමාජිකයන්ට දෙන ලද ණය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | |
|---|---|---|
| | **2013** | **2012** |
| | රු. | රු. |
| ජනවාරි 01 දිනට ශේෂය | 4,895,657 | 7,858,104 |
| එකතු කළා | | |
| වර්ෂය තුළ සාමාජිකයන්ට ලබාදෙන ලද ණය | 1,950,000 | 925,000 |
| සාමාජිකයින් විසින් වැඩිපුර ගෙවීම් නිරවුල් කිරීම | - | 26,836 |
| | 6,845,657 | 8,809,940 |
| අඩුකළා | | |
| වර්ෂය තුළ අයකර ගැනීම් | (2,234,772) | (3,914,283) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 4,610,885 | 4,895,657 |

2013 වර්ෂයේ සාමාජිකයන්ට ප්‍රදානය කරන ලද ණය 2012 වර්ෂය සමඟ සසඳන විට රු.1,025,000 කින් හෙවත් සියයට 111 කින් වැඩිවී තිබුණි. එහෙත් 2013 වර්ෂයේ අයකර ගැනීම් 2012 වර්ෂය සමඟ සසඳන විට රු.1,679,511 කින් හෙවත් සියයට 43 කින් වැඩිවී තිබුණි.

(ආ) සාමාජිකයන්ගේ විශ්‍රාම යන දිනය සැලකීමෙන් තොරව රු.1,950,000 ක් වූ පහත සඳහන් ණය මුදල් සාමාජිකයන්ට ලබාදී තිබුණි.

| සේවක අංකය | ණය ලබාදුන් දිනය | ලබාදුන් ණය මුදල | විශ්‍රාම යන දිනය | ආපසු ගෙවීම් කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|
| | | රු. | | |
| 99 | 2013 පෙබරවාරි 12 | 1,600,000 | 2015 දෙසැම්බර් 28 | වර්ෂ 10 |
| 88 | 2013 ජූනි 05 | 200,000 | 2015 මාර්තු 10 | වර්ෂ 10 |
| 88 | 2013 ඔක්තෝබර් 10 | 100,000 | 2015 මාර්තු 10 | වර්ෂ 10 |
| 960 | 2013 ජූලි 16 | 50,000 | 2015 අප්‍රේල් 06 | වර්ෂ 10 |
| | | 1,950,000 | | |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.3 ඡේදය අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 04 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**4.2 අරමුදල පිහිටුවීම, අධිකාරි බලය සහ කළමනාකරණය**

---

1975 අංක 13 දරන ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 85(2) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ - "ඒ" අර්ථසාධක අරමුදල පිහිටුවන ලදි. 1975 අංක 13 දරන ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 85(2) වගන්තියේ විධිවිධාන යටතේ මාසික හෝ දෛනික වැටුප් ලබන ලංකා රාජ්‍ය උකස් බැංකුවේ සියළුම සේවකයන් ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ සේවකයන් ලෙස සලකනු ලැබ ඔවුන් ලංකා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ රැකියාව භාර ගන්නා අතර බැංකුව විසින් ඔවුන් රැකියාවේ යෙදවීමේ කොන්දේසියක් ලෙස අර්ථ සාධක අරමුදලේ "ඒ" සාමාජිකයන් බවට පත්වේ. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සේවාදායකයා නියෝජනයවීම සඳහා නම් කරනු ලබන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකුගෙන් සහ අරමුදලේ සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ කමිටුවක් මඟින් අරමුදල පාලනය, කළමනාකරණය හා පරිපාලනය කෙරේ.